# මැතිවරණ දෙපාර්තමේන්තුව
## தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : 011-2868426

මැතිවරණ මහලේකම් කාර්යාලය
සරණ මාවත, රාජගිරිය (10107)
தேர்தல்கள் செயலகம்,
சரண மாவத்தை, இராஜகிரிய (10107)

*web : www.slelections.gov.lk* *e-mail : info@slelections.gov.lk*


| | | |
|---|---|---|
| මගේ අංකය : **PE/24/2015**<br>எனது இல. | ඔබේ අංකය :<br>உமது இல. | දිනය : 2015.07.08<br>திகதி |

චක්‍රලේඛ අංක TR/2015/04

සියළුම තේරීම් භාර නිලධාරී / දිස්ත්‍රික් ලේකම්

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය / නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,

<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2015.08.17</u>

<u>හදිසි අනතුරු වලට මුහුණ දෙන රජයේ වාහන සම්බන්ධව කටයුතු කිරීම.</u>

2015.08.17 දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණ ඡන්ද විමසීමේ මූලික සංවිධාන කටයුතු සහ ඡන්ද විමසීමේ රාජකාරී සඳහා රජයේ වාහන සෑහෙන ප්‍රමාණයක් භාවිතා කිරීමට ඔබට සිදුවනු ඇත.

02. මැතිවරණ රාජකාරී වල නිරත කරවන ලද වාහනයක් හදිසි අනතුරකට මුහුණ දුනහොත්, සාමාන්‍ය මාර්ග අනතුරකදී අනුගමනය කළ යුතු පරිදිම පොලිසියට වාර්තා කර අවශ්‍ය නීතිමය ක්‍රියා මාර්ග ගත යුතුය. ඊට පහත දැක්වෙන ක්‍රියා මාර්ග ද ඇතුළත් විය යුතුය.

I. අනතුර පිළිබඳව නොපමාව පොලිසියට දැන්වීම.

II. වාහනය පූර්ණ රක්ෂණය කර ඇත්නම්, අදාළ රක්ෂණ ආයතනයට දැන්වීම.

III. අනතුර සිදුවන අවස්ථාවේ රථය පැදවූ රියදුරුගෙන් ප්‍රකාශයක් සටහන් කර ගැනීම.

IV. අනතුර සිදුවන අවස්ථාවේ රථයේ ගමන් කළ වෙනත් පුද්ගලයින් වී නම් ඔවුන්ගේ ප්‍රකාශ සටහන් කර වාර්තාවක් ලබා ගැනීම.

V. රථයට සිදුවී ඇති හානි පිළිබඳව මාණ්ඩලික නිලධාරියෙකු ලවා පරීක්ෂා කර වාර්තාවක් ලබා ගැනීම.

03. රථය පූර්ණ රක්ෂණය කළ එකක් නම් අලාභය අදාළ රක්ෂණ ආයතනයෙන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. එහිදී සම්පූර්ණ අලාභයම ප්‍රතිපූර්ණය නොවේ නම් එය පියවීම සඳහා සියළු විස්තර ඇතුළත් ඔබගේ නිර්දේශිත වාර්තාවක් මා වෙත එවිය යුතුය.

අනතුරට පත් රථය අළුත්වැඩියා කිරීමට ප්‍රතිපාදන මෙම දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ වලින් දරනු ලබන්නේ නම් ඉහත සඳහන් ලිපි ලේඛන වලට අමතරව පහත සඳහන් විස්තර ද සැපයිය යුතුය.

- රථයට සිදුවී ඇති හානි පිළිබඳ සම්පූර්ණ විස්තරයක්
- දිස්ත්‍රික් මෝටර්රථ පරීක්ෂකගේ වාර්තාවක් සමඟ දළ ඇස්තමේන්තුවක්
- පොලිස් වාර්තාවේ සහතික කළ පිටපතක්
- අවම තරමින් රජයේ ලියාපදිංචි ගරාජ දෙකකින් ලබාගත් මිළ ගණන් වල සහතික කළ පිටපත්
- අළුත්වැඩියාව පිළිබඳව ඔබගේ නිර්දේශය

04. එමෙන්ම අනතුර පිළිබඳව මා වෙතද, වාහනය අයත් ආයතනයේ ප්‍රධානියා / ප්‍රවාහන නිලධාරී වෙතද නොපමාව දැනුම් දිය යුතුය. තවද, එවැනි අනතුරු පිළිබඳව ඔබටද නොපමාව වාර්තා කරන ලෙස ප්‍රවාහන කටයුතු භාර නිලධාරීන්ට දැනුම් දෙන්න.

05. කෙසේ වෙතත් මාර්ග නීති උල්ලංඝණය කිරීමක් හෝ බීමතින් රිය පැදවීම මත හෝ රාජකාරියෙහි යෙදුණු රියදුරු අධිකරණයක් වෙත ඉදිරිපත් කර වරදකරුවකු වී ඇත්නම්, අදාළ අලාභයන් ප්‍රතිපූරණය කිරීමට ඉල්ලුම් කිරීමට ප්‍රථම පූර්ණ පරීක්ෂණයක් පවත්වා වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට වාහනය අයත් අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / සංස්ථාව වෙත දැන්විය යුතුය. එම වාර්තාවේ නිර්දේශයන් මත අලාභය ප්‍රතිපූරණය කිරීම පිළිබඳව සළකා බැලිය හැකිය.

මහින්ද දේශප්‍රිය,

මැතිවරණ කොමසාරිස්

පිටපත් : 01. විගණකාධිපති

02. අතිරේක මැතිවරණ කොමසාරිස් (පාර්ලිමේන්තු)

03. ප්‍රධාන ගණකාධිකාරී

04. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන)

05. ගණකාධිකාරී (ගෙවීම්)


මැතිවරණ කොමසාරිස්
தேர்தல்கள் ஆணையாளர்
දුරකථන/தொலைபேசி : 011-2868444
ෆැක්ස්/ தொலைநகல் : 011-2868445
*e-mail : comelesl@sltnet.lk*

සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන)
உதவித் தேர்தல்கள் ஆணையாளர் (நிருவாகம்)
දුරකථන/தொலைபேசி : 011-2868450
ෆැක්ස්/தொலைநகல் : 011-2868450
*e-mail : admin@slelections.gov.lk*

පරිපාලන නිලධාරී
நிருவாக அலுவலர்
දුරකථන/தொலைபேசி : 011-3083371
ෆැක්ස්/தொலைநகல் : 011-3083371
*e-mail : info@slelections.gov.lk*